# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2493/30 – 2026 ජුනි මස 17 වැනි බදාදා – 2026.06.17**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උපවගන්තිය යටතේ, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍ය, කුරගමගේ දොන් ලාල් කාන්ත වන මම මෙයින් ප්‍රකාශ කරමි.

මධ්‍යම පළාතේ, මහ නුවර දිස්ත්‍රික්කයේ, දෙල්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 1035, මාඋස්සාව ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, මාඋස්සාව ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක Maha/DLT/2024/15 හා 2025.06.12 දිනැති ප්‍රගමන අනුරේඛනයේ දැක්වෙන පහත සඳහන් ඉඩම් කොටසට මායිම්:

01. කැබලි අක්ෂර ‘A’ - **බෝපිටියවත්ත - ප්‍රමාණය: හෙක්. 0.4047 ක් පමණ**

උතුරට : ජී.ජී.ඩී.එම්. වනිගසූරිය හිමිකම් කියන බෝපිටිය වත්ත සහ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව හිමිකම් කියන බෝපිටිය වත්ත;නැගෙනහිරට: ශ්‍රී විජයාරාම විහාරස්ථානය හිමිකම් කියන බෝපිටිය වත්ත;දකුණට:ශ්‍රී විජයාරාම විහාරස්ථානය හිමිකම් කියන බෝපිටිය වත්ත; බටහිරට:මාර්ගය (මාර්ග සංවර්ධන අධිකාරිය) සහ ජී.ජී.ඩී.එම්.වනිගසූරිය හිමිකම් කියන බෝපිටිය වත්ත.

**කේ. ඩී. ලාල් කාන්ත,**
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ
වාරිමාර්ග අමාත්‍ය.

*මගේ අංකය*: 4-3/8/2011/PC/325
2026 අප්‍රේල් මස 28 වැනි දින,
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය,
“මිහිකත මැදුර”,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

EOG 06 – 0147


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*